# විවාහක ආබාධිත රණවිරුවන් නිසා ඔවුනට සහ ඔවුන්ගේ පවුල්වලට වන ප්‍රජාවිද්‍යාත්මක සමාජ හා ආර්ථික බලපෑම

පී.ජී.එම්. බණ්ඩාර - ප්‍රජාවිද්‍යා අධ්‍යයනාංශය

දශක තුනකට ආසන්න කාලයක් පුරාවට ශ්‍රී ලංකාවේ පැවති යුධමය තත්වය හේතුවෙන් සමස්ත සමාජ පද්ධතියටම දැඩි බලපෑමක් එල්ල විය. ඒ අනුව විශාල සංඛ්‍යාවක් රණවිරුවන් මියගිය අතර ඒ හා සමානම පිරිසක් ආබාධිත තත්වයට පත් විය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වනුයේ විවාහක ආබාධිත රණවිරුවන් නිසා ඔවුනට සහ ඔවුන්ගේ පවුල්වලට වන ප්‍රජාවිද්‍යාත්මක සමාජ හා ආර්ථික බලපෑම අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජීවත් වන පූර්ණ හා අර්ධාබාධිත රණවිරුවන් 100 දෙනෙකු අරමුණුගත නියැදියකට අදාළව තෝරා ගැනුණි. එහිදී ප්‍රාථමික දත්ත රැස් කිරීම ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් සිදු කළ අතර ආයතනික දත්ත වාර්තා මෙන්ම අන්තර්ජාල දත්ත වාර්තා ආදිය ද්විතීයික දත්ත මූලාශ්‍රය ලෙස භාවිත කෙරුණි. අධ්‍යයන ප්‍රතිඵල අනුව බහුතරයක් රණවිරුවන් වයස අවුරුදු 23-27 වැනි ඉතාමත් අඩු වයසකදී ආබාධිතභාවයට පත්ව ඇති බව හඳුනා ගත හැකි විය. විවාහක ආබාධිත රණවිරුවන්ගේ භාර්යාවන් ද වයස අවුරුදු 19-23 හා 24-29 යන වයස් කාණ්ඩවලදී මෙම ගැටලුවට මුහුණ පා ඇත. මෙම දෙපිරිස ම ඉතාමත් තරුණ වයසේදී ම මෙම ගැටලුවට මුහුණ පෑම හේතුවෙන් මානසික වශයෙන් කඩා වැටීමකට ලක්ව ඇති බවටත්, සඵලතාවට බලපෑමක් එල්ල වී ඇති බවටත් අධ්‍යයන ප්‍රතිඵලවලින් තහවුරු විය. ඒ අනුව 5% එක් දරුවෙකු පමණක් සිටින පවුල් වේ. මෙහි පූර්ණ වශයෙන් ආබාධිත තත්වයට පත් රණවිරුවන් හඳුනා ගත හැකිය. උපත්පාලන ක්‍රම පිළිබඳව අවධානය යොමු කරන විට බහුතරයක් උපත්පාලන ක්‍රම භාවිත කරති. ඒ අතුරින් වඩාත් ජනප්‍රිය උපත්පාලන ක්‍රමය වන්නේ ජඩෙල්ලා හා උපත්පාලන පෙතිය. අධ්‍යයනයට ලක්වූ රණවිරු පවුල්වලින් අඩක් පමණ රණවිරුවන් සමාජය තුළදී විවිධ ගැටලුවලට මුහුණ දෙන තත්වයක් පවතී. රණවිරු පවුල්වල ස්වාමිපුරුෂයාට හිමි මාසික වැටුප හා දුබලතා විශ්‍රාම වැටුප ආදිය ලැබුණ ද එය නිසි පරිදි කළමනාකරණය කර නොගැනීම තුළ ආර්ථික ගැටලු මතු වුවද (30%) බහුතරයකට එම වැටුප පවුලේ වියදම්වලට ප්‍රමාණවත් වේ. (70%). මේ අනුව ආබාධිත රණවිරුවාගේ, භාර්යාවගේ හා දරුවන්ගේ මානසික තත්ත්වය නගා සිටුවීම සඳහා රාජ්‍ය මට්ටමින් උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. තවද ගෘහ ආර්ථික කළමනාකරණය පිළිබඳ දැනුම අවම වන හෙයින් පවුලේ අභිවෘද්ධිය සඳහා මුදල් කළමනාකරණය කර ගැනීමට නිසි වැඩපිළිවෙලක් සකස් කිරීම ඔවුන්ට ප්‍රතිඵල දායක වනු ඇත.

***ප්‍රමුඛ පදඃ*** *සඵලතාව, උපත්පාලනය, ආබාධිත රණවිරුවන්*